# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන
5 වන කාණ්ඩය
නොවැම්බර් 2020




01 කෝප් කමිටුව පළමු වතාවට ඔන්ලයින් තාක්ෂණය යොදා ගනී

02 නිදහස් ශ්‍රී ලංකාවේ 75 වන අයවැය පාර්ලිමේන්තුවට

03 ජනමාධ්‍ය උපදේශක කාරක සභා රැස්වීමේදී වෙබ් අඩවි නියාමනය පිළිබඳව දීර්ඝ සාකච්ජාවක්

04 මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී අක්‍රමිකතා රැසක් - කෝප් කමිටුවේදී හෙළි වෙයි

06 ඉතිහාසයේ පළමු වරට ජනපතිවරුන් තිදෙනෙකු පාර්ලිමේන්තු සභා ගැබට

06 කොවිඩ් 19 වසංගතය පාලනය වෙනුවෙන් රුපියල් මිලියන 70,000ක්



සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව



# කෝප් කමිටුව පළමු වතාවට ඔන්ලයින් තාක්ෂණය යොදා ගනී



පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ප්‍රථම වරට ඔන්ලයින් තාක්ෂණය යොදා ගනිමින් ( Zoom ) අමාත්‍යාංශ 03ක ලේකම්වරු පසුගිය නොවැම්බර් 26 වැනිදා පැවති සාකච්ඡාවට සම්බන්ධකර ගත්හ.

කෝප් කමිටුව එහි සභාපති මහාචාර්ය චරිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භවීමෙන් පසු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය සංජීව මුණසිංහ, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලිව්. ඒ. චූලානන්ද පෙරේරා මහතා සහ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ. ජේ. රත්නසිරි මහතා මෙලෙස ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ සහභාගී වූහ.

කැලණි ගඟේ ජල දූෂණය සම්බන්ධයෙන් වන විගණන වාර්තාව කෝප් කමිටුවේදී අවධානයට යොමු වූ අතර එහිදී කිසිදු හෝ තාක්ෂණික දෝෂයකින් තොරව සභාපති චරිත හේරත් මහතා ඇතුළු මැති ඇමතිවරු සහ අමාත්‍යාංශ ලේකම්වරු අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සමඟ සංවාදය පැවැත්වූහ.

පාර්ලිමේන්තුවේ කමිටු රැස්වීම් ශාලා දෙකක මේ වන විට ඔන්ලයින් තාක්ෂණය යොදා ගනිමින් රැස්වීම් හා සාකච්ඡා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් යොදා ඇති බව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා පැවසීය. පාර්ලිමේන්තුවේ නිලධාරීන් මාස ගණනාවක් තිස්සේ මෙම තාක්ෂණික මෙවලම් ස්ථාපනය කිරීමට වෙහෙස වූ බවත් එම උත්සාහයන් මේ වන විට සාර්ථක වී ඇති බැවින් ඉදිරියේදී පාර්ලිමේන්තු රැස්වීම් ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පැවත්විය හැකි බවත් මහලේකම්වරයා සඳහන් කළේය.

මීට දින කිහිපයකට පෙර කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වූ උසස් නිලතල පිළිබඳ කාරක සභාවද ඔන්ලයින් තාක්ෂණය යොදා ගනිමින් උගන්ඩාවේ රැදී සිටි කෙන්යාවේ නව ශ්‍රී ලංකා තානාපතිවරයා සමඟ සාකච්ඡා පැවත්විය.



# නිදහස් ශ්‍රී ලංකාවේ 75 වන අයවැය පාර්ලිමේන්තුවට

2021 මූල්‍ය වර්ෂය සඳහා රජයේ ආදායම් සහ වියදම් සහ ණය සීමා සම්බන්ධව ඉදිරිපත් කරන සවිස්තරාත්මක ලේඛනය හෙවත් විසර්ජන කෙටුම්පත දෙවන වර කියවීම පිණිස අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මහතා විසින් නොවැම්බර් 17 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිණි. මෙම විසර්ජන පනත් කෙටුම්පත පසුගිය ඔක්තෝබර් 06 වැනිදා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූවකි.

2021 අයවැය මඟින්, එම මුදල් වර්ෂයට අදාළව රජයේ සේවා වියදම් සඳහා රුපියල් බිලියන 2678ක් වෙන් කිරීම සහ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව රුපියල් බිලියන 2900ක සීමාවකට යටත්ව ණය ලබා ගැනීමට මෙම විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබුණි.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කළ අයවැය මෙරට ඉතිහාසයේ 75 වැනි අයවැය වාර්තාව ලෙස සැලකෙන අතර, පාර්ලිමේන්තු ඉතිහාසයේ වැඩිම අයවැය ලේඛන ගණනක් ඉදිරිපත් කිරීමෙහි වාර්තාව හිමිව ඇත්තේ, අයවැය දොළසක් ඉදිරිපත් කළ හිටපු මුදල් අමාත්‍ය රොනී ද මැල් මහතාටය.දෙවැනියට වැඩිම අයවැය ලේඛන ගණනක් ඉදිරිපත් කර තිබෙන්නේ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා වන අතර තෙවැනියට වැඩිම අයවැය ලේඛන(09ක්) ගණනක් ඉදිරිපත් කර ඇත්තේ හිටපු ජනාධිපති සහ මුදල් අමාත්‍ය ජේ. ආර්. ජයවර්ධන මහතා වේ.

ප.ව. 1.45 සිට ප.ව. 4.50 දක්වා හෝරා දෙක හමාරකට ආසන්න කාලයක් අග්‍රාමාත්‍යවරයා විසින් අයවැය ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී. අය වැය අතරතුරදී සාම්ප්‍රදායානුකූලව මුදල් අමාත්‍යවරයා විසින් පවත්වන ලද තේ පැන් සංග්‍රහය ද පැවැත්විණි. අය වැය ඉදිරිපත් කිරීමෙන් පසු 18 වැනි දින සිට සෙනසුරාදා 21 දින තෙක් අයවැය දෙවන වර කියවීමේ විවාදය පැවැත්විණි. අයවැය කාරක සභා අවස්ථාව 23 වැනිදා සිට දෙසැම්බර් 10 වැනිදා දක්වා පැවැත්වේ. දෙසැම්බර් 10 වැනි දින පස්වරු 5.00ට තෙවැනි වර ඡන්ද විමසීම පැවැත්වෙනු ඇත.

අයවැය යෝජනාවලිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ දිනයේ සිට 2021 අයවැය විවාදය පැවැත්වීමට නියමිත දින 21ක සම්පූර්ණ කාල සීමාව තුළ කොවිඩ් 19 ට අදාළ සියලු සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව එම රැස්වීම් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

“ වත්මන් ලෝක බලවතුන් අතරට එක්ව සිටින අසල්වැසි ඉන්දියාවේ මෙන් දීර්ඝ සහ පොහොසත් ඉතිහාසයකට උරුමකම් කියන රටක් ලෙසින් ශ්‍රී ලංකාවේ වටිනාකම් තවදුරටත් වර්ධනය කර ගනිමින් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍ය දැක්ම සංකල්පයට උපායමාර්ගිකව ප්‍රවේශ වීම පිණිස ඇවැසි ඉදිරි ඉලක්ක මෙම අයවැය කතාවේ අවධානයට ලක්ව තිබිණි.

ඒ අතර, ආදායම් විෂමතා සහ ග්‍රාමීය නාගරික අසමානතාව අවම කරලීම, සමාජ ආරක්ෂණය, ක්‍රීඩා හිතකාමී ජන සමාජයක් කරා යොමුවීම, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, සමාජ ආරක්ෂණය, යටිතල පහසුකම් සංවර්ධනය, සද්භාවයකින් සේවය කරන රාජ්‍ය සේවය, සම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳව නව දැක්මක් හා දේශීය කෘෂිකර්මාන්තය ප්‍රචලිත කිරීම, ඊ - තක්සලාව, තරුණ ව්‍යවසායකයින්ට නව ආයෝජන අවස්ථා, වසර පහක නොවෙනස් සරල බදු ප්‍රතිපත්තිය, නව ආයෝජන කලාප, ගමට බලාගාරයක්, විදේශ රැකියා ප්‍රතිසන්ධානය, රාජ්‍ය ව්‍යවසාය පිබිදීම, වතුකම්කරුවන්ට රු.1000 ඇතුළු වතු සමාගම් ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ වැනි විශේෂ ඉලක්ක ද මෙම සාර්ව ආර්ථික එළඹුම මඟින් යෝජනා කෙරිණි.

මීට අමතරව Covid-19 අභියෝගය හමුවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය පුළුල්කරණය ඇතුළු සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ද ප්‍රතිපාදන වෙන් කර ඇත. ”

# ජනමාධ්‍ය උපදේශක කාරක සභා රැස්වීමේ දී වෙබ් අඩවි නියාමනය පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක්



වෙබ් අඩවි නියාමනයට නිසි වැඩපිළිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කරන බව පැවසූ කෙහෙළිය රඹුක්වැල්ල මහතා පුරවැසියන්ගේ ආත්ම ගරුත්වය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම වෙනුවෙන් පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කරන බවද මෙහිදී අවධාරණය කළේය.

ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති එම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා රැස්වීමේදී වෙබ් අඩවි නියාමනය පිළිබඳව දීර්ඝව සාකච්ඡා කළේය.

සමාජ මාධ්‍ය මඟින් ජාතිවාදය ඇවිස්සීමට ගන්නා උත්සහය පාලනය කල යුතු බවත්, ඒ සම්බන්ධව ස්වයං නියාමන ක්‍රමවේදයක් සැකසීම පිළිබඳව 2015 වසරේදී ද සාකච්ඡා කළ බව මන්ත්‍රීවරු එහිදී පෙන්වා දුන්හ. එමෙන්ම සමාජ මාධ්‍ය මඟින් සිදුවන ජාතිවාදී තොරතුරු පාලනය වෙනුවෙන් සිංගප්පූරුවේ නව පනතක් සම්මත වූ බවත්, එයද අධ්‍යයනය කර නව වැඩපිළිවෙලක් සැකසිය යුතු බවත් මෙහිදී සාකච්ඡා විය.

මෙයට අමතරව රූපවාහිනී සහ ගුවන් විදුලි මාධ්‍ය නියාමනයට නිසි ක්‍රමවේදයක් සැකසිය යුතු බවටත්, පාර්ලිමේන්තු සභාවාර සජීවීව විකාශය කිරීම නැවත වරක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මඟින් ආරම්භ කිරීම සඳහාත් සාකච්ඡා විය.

මහාචාර්ය ජී.එල්. පීරිස්, මහින්ද අමරවීර, මහාචාර්ය චරිත හේරත්, ආචාර්ය සුරේන් රාඝවන්, මනූෂ නානායක්කාර, ඉසුරු දොඩංගොඩ, ගුණතිලක රාජපක්ෂ, සාගර කාරියවසම්, ජයන්ත වීරසිංහ යන අමාත්‍යවරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුද රාජ්‍ය නිලධාරීහු ඇතුළු පිරිසක්ද මීට එක්ව සිටියහ.



**විශේෂාංග**

# මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී අක්‍රමිකතා රැසක් - කෝප් කමිටුවේදී හෙළි වෙයි




මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේදි අක්‍රමිකතා රැසක් සිදුවී ඇති බව පාර්ලිමේන්තුවේදී පසුගියදා පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී (කෝප්) අනාවරණය විය. මෙම මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනයට පමණක් රු. බිලියන 1.7 කට වැඩි මුදලක් වැය වී ඇති බව මෙහිදී තහවුරු විය.

මේ අතර මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත සිට මීරිගම දක්වා පළමු කොටසේ වැඩ කටයුතු ආරම්භ වීම 2015 සිට 2019 දක්වා ප්‍රමාද වීම නිසා රුපියල් බිලියන 08ක මූල්‍ය අලාභයක් සිදුවී ඇති බවද මෙහිදී අනාවරණය විය.

මෙහිදී පළමු ශක්‍යතා අධ්‍යනය සඳහා SMEC සමාගම තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව සිදුව ඇති බව අනාවරණය විය. තවද 2012 දි උතුරු අධිවේගි මාර්ගය ලෙස පියවර 03ක් යටතේ පැවති ව්‍යාපෘතිය 2015 වර්ෂය වන විට මධ්‍යම අධිවේගී මාර්ගය ලෙස පියවර 04 ක් යටතේ වෙනස්ව තිබේ.

මේ අනුව එඬේරමුල්ල සිට මීරිගම දක්වා ඉදිකිරීමට තිබූ මාර්ගය කඩවත සිට ඉදිකිරීමට තිරණය කොට ඇති අතර, එම තීරණය නිසා තවත් ශක්‍යතා අධ්‍යයන කිහිපයක් විශාල මුදලක් වැය කර සිදු කර ඇත.වසර 2015 දී කිසිඳු හෝ විද්වත් මත විමසීමකින් තොරව කැබිනට් මණ්ඩලය විසින් මෙම තීරණය ගෙන ඇති බව මෙහිදි අනාවරණය විය.

මෙලෙස මුල් ව්‍යාපෘතිය වෙනස්වීම නිසා සිදුවූ මූල්‍ය අලාභය පිළිබඳ වාර්තාවක් වහාම ලබා දෙන ලෙසද කෝප් සභාපති මහාචාර්ය චරිත හේරත් මහතා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියෝග කළේය.

එසේම මධ්‍යම අධිවේගී මාර්ගයේ තෙවැනි කොටස වන පොතුහැර - ගලගෙදර කොටසේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අක්‍රමිතා නිසා තවමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන්ව නොමැති බව මෙහිදි අනාවරණය විය. ටෙන්ඩර් පටිපාටිය අනුව MS Taisei නම් සමාගමට මෙය ටෙන්ඩරය හිමිවිය යුතුව තිබුණද Fujita නම් සමාගමට මෙම ලබා දෙන ලෙස CCEM කමිටුව මඟින් බලපෑම්කර ඇති බවත් එමඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වී ඇති බවටද කරුණු අනාවරණය විය.

පසුගිය 20 වැනිදා රැස් වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අමාත්‍ය මහින්ද අමරවීර, රාජ්‍ය අමාත්‍ය සරත් වීරසේකර, රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම, රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන එරාන් වික්‍රමරත්න, ජගත් පුෂ්පකුමාර, ප්‍රේමනාත් සී. දොලවත්ත, රන්ජන් රාමනායක, ඩී.වී. චානක යන මහත්වරු සහභාගී වූහ.

**පුවත්**

# ජනාධිපතිතුමා අය වැය දෙවන වර කියවීමේ අවස්ථාවට සහභාගී වීමට පාර්ලිමේන්තුවට



අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2021 අය වැය දෙවනවර කියවීමේ අවස්ථාවට සහභාගී වීම සඳහා නොවැම්බර් 19 වැනිදා පෙ.ව. 11.40ට පමණ පාර්ලිමේන්තුවේ සභා ගර්භයට පැමිණියේය. පෙ.ව. 11.30ට පමණ පාර්ලිමේන්තු පරිශ්‍රයට පැමිණි ජනාධිපතිතුමා එතුමාගේ කාර්යාලයේ සුළු වේලාවක් රැඳී සිටියේය.

09 වන පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කිරීමෙන් අනතුරුව අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ සභා ගර්භයට පිවිසි ප්‍රථම අවස්ථාව මෙයයි.

ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ උණුසුම් පිළිගැනීම මධ්‍යයේ සභා ගර්භයට පිවිසි ඒ මහතා විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක මහතාගේත්, රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතාගේත්, පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණි ගුණවර්ධන මහතාගේත් අදහස් වලට සවන් දීමට කටයුතු කළේය.

ඉන් අනතුරුව අග්‍රාමාත්‍යවරයා, මැති ඇමතිවරුන් සහ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයන් සමඟ මන්ත්‍රී භෝජනාගාරය වෙත ගිය ජනාධිපතිතුමා එහිදී දිවා භෝජනයට සහභාගි විය. ප.ව. 01.50 ට පමණ ජනාධිපතිතුමා පාර්ලිමේන්තු පරිශ්‍රයෙන් නික්ම ගියේය.



## පුවත්

# ඉතිහාසයේ පළමු වරට ජනපතිවරුන් තිදෙනෙකු පාර්ලිමේන්තු සභා ගැබට




පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමු වරට ජනාධිපතිවරුන් තිදෙනෙකු සභා ගර්භයේ ආණ්ඩු පක්ෂයේ ඉදිරිපෙළ අසුන් ගෙන සිටීම විශේෂත්වයක් විය.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2021 අය වැය දෙවනවර කියවීමේ විවාදය සඳහා සහභාගීවීමට නොවැම්බර් 19 වැනිදා පාර්ලිමේන්තුවට පැමිණ සභා ගර්භයේ අසුන් ගත් අතර, එතුමා සමඟ හිටපු ජනාධිපති සහ වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ද වූහ. ඔවුන් දෙදෙනා සමඟ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාද තම ආසනයේ සිටිමින් විවාදයට සහභාගී විය.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005 වසරේ සිට 2015 දක්වා අවස්ථා දෙකක දී ජනාධිපතිධූරය හෙබවීය. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2015 වසරේ සිට 2019 වසර දක්වා ජනාධිපතිධූරය හෙබවීය.

# කොවිඩ් 19 වසංගතය පාලනය වෙනුවෙන් රුපියල් මිලියන 70,000ක්



කොවිඩ් 19 වසංගතය පාලනය වෙනුවෙන් රුපියල් මිලියන 70,000ක් මේවන විට වියදම් කර තිබෙන බව 2020 අයවැය කථාව ඉදිරිපත් කරමින් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේදී පැවසීය. රෝගීන් හඳුනාගැනීම, නිරෝධායන නියමු පරීක්ෂණ සහ ආශ්‍රිත සුභසාධන කටයුතු වෙනුවෙන් මෙම මුදල වැය කර තිබේ.
රෝග නිවාරණ කටයුතු සඳහා කොළඹට පමණක් සීමා වී තිබූ රෝහල් ධාරිතාවය වසරකටත් අඩු කාලයකින් දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි රෝහල් 17ක් දක්වා වැඩිකර තිබෙන බවද හෙතෙම කීවේය.

කොරෝනා රෝගයට ගොදුරු වූවන් සඳහා විශේෂ ප්‍රතිකාර කිරීමේ ඇඳන් සංඛ්‍යාව 600ක් පමණ මට්ටමක රෝග පරීක්ෂා කිරීමේ පී.සී.ආර් ධාරිතාවය දිනකට 7500-100000 වැඩි කර ගැනීමට හැකිවී තිබෙන අතර, එම එක් පරීක්ෂණයක් සඳහා වැයවන රුපියල් 6000ක මුදල් ප්‍රමාණය තුළ දිනක වියදම රුපියල් මිලියන 50ක් ඉක්මවා තිබෙන බවද අග්‍රාමාත්‍යවරයා පැවැසීය.

දින 14 ක රෝග නිවාරණයට ලක් කරන පුද්ගලයින්ගේ ආහාර සහ සුභසාධනයටද විශාල මුදලක් රජය වැය කරන බවද අග්‍රාමාත්‍යවරයා මෙහිදී කීවේය. කෝවිඩ් 19 වසංගතය නිසා ආදායම් තත්ත්වය අඩුවීමේ බලපෑම්වලට ලක්වූ පවුල්වලට රුපියල් 5000ක දීමනාවද ලබා දීම අඛණ්ඩව සිදුවේ. මෙම වියදම්වලට අමතරව එම සේවාවන්වල යෙදෙන රාජ්‍ය සේවකයින්ගේ දීමනා හා අනෙකුත් වියදම් දැරීමටද රජයට සිදුව තිබෙන බවද අග්‍රාමාත්‍යවරයා වැඩිදුරටත් පැවසීය.

විශේෂාංග

# "කාන්තාවන්ට ඡන්ද සටනට මුහුණදීම එතරම් පහසු කාරණයක් නොවේ"


*මහාචාර්ය නිලන්ති ද සිල්වා මිය,*

*උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය*




**01) ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන්න ඔබතුමිය අර්ථ දක්වන්නේ කෙසේද ?**

මට මේක දැනෙන්නේ ජීව විද්‍යාත්මක සංසිද්ධියක් විදියට. ජීව විද්‍යාත්මකව ස්වාභාවයෙන් සියලුම ජීවීන් ස්ත්‍රී පුරුෂ යන බෙදුමට ලක්ව උපත ලබනවා. ස්ත්‍රීය හා පුරුෂයා අතර ඇති මෙම ජීවවිද්‍යාත්මක ලිංගික වෙනස නිසා ඔවුනොවුන්ගේ අඟපසඟ ඉන්ද්‍රියන් හා ශරීර වර්ධනය වෙනස් අයුරින් සිදු වෙනවා. මෙම වෙනස ස්වාභාවිකවම නිර්මාණය වූ ජීව විද්‍යාත්මක වෙනසක්. මේ කාරණය පිළිබඳව ලංකාවේ තිබෙන මතය කුමක්ද යන්න පිළිබදවත් පූර්ණ අධ්‍යයනයක් සිදු කළ යුතුයි. දරුවන් පෝෂණය කිරීම, රැක බලා ගැනීම, ගේ දොර කටයුතු, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වැනි දේ කාන්තාවන් ඉටු කරන රාජකාරි ලෙස සැලකෙනවා, වෙළඳාම, ගොවිතැන හෝ වෙනත් රැකියා, ස්ත්‍රීන්ට හා දරුවන්ට ආරක්ෂාව සැපයීම වැනි කාරණා පුරුෂයින්ගේ රාජකාරි ලෙස සැලකෙනවා.

**02) කාන්තාවගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීමට ඔබතුමිය දක්වන්නා වූ යෝජනා කවරේද ?**

කාන්තාවන්ගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීම ප්‍රබල ගැටලුවක්. නමුත් මම කියන්න ඕන අධ්‍යාපනය අතින් මෙරට කාන්තාවන්ට එතරම් අගතියක් නෑ. විශ්වවිද්‍යාල වලට බහුතරයක් ඇතුළු වන්නේ ගැහැනු ළමයින්. නමුත් වර්තමාන සමාජ සන්දර්භය තුළ කාන්තාවගේ හඬට තැනක් නෑ. ඒක විශ්වවිද්‍යාල පද්ධතිය තුළත් එහෙමයි. කාන්තාවගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීමට නම් සමාජය සහ බලධාරීන් කාන්තාවගේ හඬට ඉඩක් ලබා දෙන්න ඕන.

**03) කාන්තාවගේ දේශපාලන සහභාගීත්වය අවම මට්ටමක පවතිනවා. මේ සම්බන්ධව ඔබේ අදහස කුමක්ද ?**

ඇත්තටම කාන්තාවගේ දේශපාලන සහභාගීත්වය අවම මට්ටමක තමයි පවතින්නේ. ලෝකයේ අනෙකුත් රටවල් සමඟ සන්සන්දනය කරද්දි ලංකාව ඒ අතින් තව ගොඩක් ඉදිරියට ගමන් කරන්න ඕන. පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ මන්ත්‍රීවරියන් 12 ක් පමණයි. ලංකාවේ ජනගහනයෙන් 52%ට ආසන්න සංඛ්‍යාවක් සිටින්නේ කාන්තාවන්. ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වාම මේ තත්ත්වය දකින්නට ලැබෙනවා.මෙය වෙනස් වෙන්න ඕන. ලංකාවේ මැතිවරණ ක්‍රමය තුළ කාන්තාවන්ට ඡන්ද සටනට මුහුණදීම එතරම් පහසු කාරණයක් නෙවේ. ඒක තමයි ඇත්ත තත්ත්වය. මේ සඳහා විසඳුමක් ලෙස පවතින මැතිවරණ ක්‍රමය යම් සංශෝධනයකට ලක්විය යුතුයි. කාන්තාව අගය කිරීමට ලක් විය යුතුයි.

**04) ගැහැණු ළමයාගේ අධ්‍යාපනික තත්ත්වය තවදුරටත් ඉහළ නැංවීමට ඔබතුමිය ඉදිරිපත් කරන යෝජනා කවරේද ?**

ගැහැණු ළමයාට හොඳ අධ්‍යාපන තත්ත්වයක් තියෙනවා. එය ඉතා වැදගත්. නමුත් නාගරික මට්ටමේ වගේම ග්‍රාමීය පාසල් වලත් පහසුකම් සංවර්ධනය වෙන්න ඕන. එලෙස නොවන්නේ නම් පවතින තත්ත්වය වෙනස් වෙනවා. ගැහැණු ළමයාටද සමාන ඉඩ ප්‍රස්තා ලබා දීම ඉතා වැදගත්. අධ්‍යාපනික අංශයන්ගේ දියුණුව සඳහා ගැහැණු ළමයාගේද අදහස් හා යෝජනා ලබා ගැනීම ඉතා වැදගත් වනවා.

**05) ඔබතුමිය කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපතිතුමිය, ඒ අනුව උසස් අධ්‍යාපන අංශයේ දියුණුවට ඔබතුමිය දක්වන්නා සහයෝගය කෙසේද ?**

විශේෂයෙන්, මෙරට විශ්වවිද්‍යාල තුළ තත්ත්ව රක්ෂණය ඉහළ නැංවිය යුතුයි. මෙය විශ්වවිද්‍යාල පාඨමාලා සඳහා ඉතා වැදගත්, ඒ වගේම



විශ්වවිද්‍යාල තුළ ශිෂ්‍ය සුබසාධනය ඉහළ නැංවීම ඉතාම වැදගත් කාරණයක්. සමස්තයක් ලෙස ගත් කල ආපන ශාලාවල තත්ත්වය කෙරෙහි අපිට එතරම් සතුටු වෙන්න බෑ. මම ඒ කාරණා පිළිබඳව අධ්‍යයනය කරනවා. කැලණිය විශ්වවිද්‍යාලය තුළ ඉතා පැහැදිලි වෙනසක් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. ඒ වගේම උසස් අධ්‍යාපන අංශයන්ගේ දියුණුවට අදාළව පවතින යෝජනා අදාළ අංශයන්ට දැනුම් දීමටත් මම බලාපොරොත්තු වෙනවා.

**06) කාන්තා අයිතිවාසිකම් පිළිබඳව ඔබතුමියගේ අදහස කුමක්ද ?**

සාමාන්‍ය වශයෙන් මෙරට කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වෙලා තියෙනවා. නමුත් ඇතැම් අංශයන්ගේ දුර්වලතා තියෙනවා. මෙරට කාන්තාවන්ට විදෙස් පුරවැසිභාවය පිළිබඳව ගැටලු සහගත තත්ත්වයක් පවතිනවා. එමෙන්ම මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ගැන බලද්දි විශාල ගැටලුවක් පවතිනවා. විවාහය වැනි කාරණා පිළිබඳව පවතින නීතිය සමාන වෙන්න ඕන.

**07) කාන්තා ප්‍රජාවට ඔබතුමිය ලබා දෙන්නා වූ පණිවිඩය කුමක්ද ?**

කාන්තාවක් වීම තමාගේ දුර්වලතාවයක් ලෙස නොසිතිය යුතුයි. බොහෝ කාන්තාවන් සිතනවා කාන්තාවක් වීම හේතුවෙන්ම ඇතැම් කාරණා සඳහා තමන් නුසුදුසු බව. මේ තත්ත්වය වෙනස් විය යුතුයි. කාන්තාව තමා පිළිබඳව අභිමානයකින් ජීවත් විය යුතුයි. කළ යුතු දේ මෙන්ම නොකළ යුතු දේ පිළිබඳව තීරණය කිරීමට කාන්තාවට පැහැදිලි අයිතියක් තියෙනවා.

සාකච්ඡා කළේ -
***එදිරිවීර ගුණසේකර***
***මාධ්‍ය නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

# වෛද්‍ය ආඥා පනතේ නියෝග 02 ක් පාර්ලිමේන්තුවේදී සම්මතයි



වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග 02 ක් පාර්ලිමේන්තුවේදී සම්මත විය. ඉන් එක් නියෝගයක් වුයේ මෙරට වෛද්‍ය සභාවේ ලියාපදිංචි වූ වෛද්‍යවරයෙක් බවට පත් වීමට නම් අවම වශයෙන් උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවෙන් සම්මාන සාමාර්ථ 02 ක් සහ සාමාන්‍ය සාමාර්ථ 01 ක් මූලික සුදුසුකම් වශයෙන් පැවතිය යුතුය යන්නයි.

ඊට ජාතික ජනබලවේගයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා තම විරෝධය පළ කල අතර, ඔහු යෝජනා කර සිටියේ වසරින් වසර එම සුදුසුකම සංශෝධනයට ලක්වන ලෙස නියෝගය ආඥාපනතට එක් කල යුතු බවයි. එබැවින් නියෝග 02 සම්මත නොකර උපදේශක කාරක සභාවේදී ඒ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කර සංශෝධනය කළ යුතු බවට ඔහු යෝජනා කළේය. එහෙත් එයට ආණ්ඩු පක්ෂය එකඟ නොවූ අතර පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී එකඟ වූ පරිදි එම නියෝග සම්මත කළ යුතු බවට සභානායක දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේදි පෙන්වා දුන්නේය.

ඉන්පසු දිසානායක මහතාගේ විරුද්ධත්වය සටහන් කර ගැනීමෙන් අනතුරුව අදාළ නියෝග පාර්ලිමේන්තුවේ දී සම්මත විය.

# නිසි වේලාවට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා කඩිනම් වැඩපිළිවෙළක්



නිසි වේලාවට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ක්‍රමවේදයක් කඩිනමින් සකසන බව අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා පැවසීය.

නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය වෙනුවෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පළමුවරට නොවැම්බර් 23 වැනිදා රැස් වූ අවස්ථාවේ පාර්ලිමේන්තු මන්ත්‍රී චන්දිම වීරක්කොඩි මහතා යොමු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

මාසයක් ඇතුළත විශ්‍රාම ලබා ගන්නා රාජ්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව පිළිබඳ දත්ත රැස්කර තබා ගන්නා ලෙස කාරක සභාව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට දැනුම් දුන්නේය. විශ්‍රාම වැටුප් අහිමි වීමට බලපාන කාරණා නැවත සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව ද කාරක සභාවේදී සාකච්ඡා විය. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා නිලධාරීන්ගේ සේවය නැවත රාජ්‍ය සේවයට ලබා ගැනීම සම්බන්ධවද කාරක සභාවේ අවධානය යොමු විය.

කඩිනමින් පළාත් සභා මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යවරයාගෙන් උපදෙස් විමසා ඇති බව රාජ්‍ය අමාත්‍ය රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතා කාරක සභාවට දැනුම් දුන්නේය. එම මැතිවරණය පවත්වන්නේ සමානුපාතික නියෝජන ක්‍රමයටද, මිශ්‍ර සමානුපාතික ක්‍රමයටද යන්න පිළිබඳව ගරු අග්‍රාමාත්‍යවරයාගෙන් උපදෙස් විමසා තිබේ.

සීමා නිර්ණ කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා ක්‍රියා කරන බවත්, ඒ සඳහා 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ වෙනම කොමිෂන් සභාවක් පිහිටුවන බවත් අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා කාරක සභාවේදී පැවසීය.

කොට්ඨාස ක්‍රමයෙන් පළාත් පාලන ආයතන සඳහා මන්ත්‍රීවරයන් පත් කිරීම ගැටලු සහගත බව සභාවේ සාකච්ඡා වූ අතර, නව මැතිවරණ ක්‍රමයද සමාලෝචනය කළ යුතු බව එහි මතය විය. අනවශ්‍ය ලෙස ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයන් නඩත්තු කිරීමට සිදුවීම ගැටලුවක් වී තිබේ. පළාත් පාලන මැතිවරණ ක්‍රමයේ අඩුපාඩු කඩිනමින් ඉවත් කිරීමට ක්‍රියා කරන බව අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා පැවසීය. රාජ්‍ය නිලධාරීන්ටද පළාත් පාලන ක්‍රමයට ඇතුළු වීමට අවස්ථාව ලබා දීම සඳහා සාකච්ඡා කෙරෙන බවද අමාත්‍යවරයා කීවේය.

පළාත් පාලන ආයතන 83 ක් අලුතින් පිහිටුවීම සඳහා යෝජනා ඉදිරිපත් වී තිබෙන අතර, ඒ සඳහා දිස්ත්‍රික් කමිටුද පත්කර තිබෙන බව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී අනාවරණය විය.

මේ අවස්ථාවට ගරු අමාත්‍යවරු සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 30කට අධික සංඛ්‍යාවක් සහභාගී වී සිටීම විශේෂත්වයක් විය. රාජ්‍ය නිලධාරීහු පිරිසක් ද කාරක සභාවට එක්ව සිටියහ.

**විශේෂාංග**

# සර්වජන ඡන්දයෙන් දිනූ කත ෆ්ලෝරන්ස් සේනානායක



1903 ජූනි 03 දින මොරටුව රාවතාවත්තේ දී අට දෙනෙකුගෙන් යුත් පවුලක ජන්ම ලාභය ලද ඩේසි මාරියා ෆ්ලොරන්ස් සේනානායක දේශපාලන පවුල් පසුබිමකින් පැවත එන කාන්තාවක් නොවීම විශේෂත්වයකි. ඇගේ පියා  වූ කේ.ඊ. මෙන්ඩිස් වැවිලිකරුවෙකු වූ අතර ඇය මොරටුව වේල්ස් කුමරි විදුහලෙන් අධ්‍යාපනය හදාළාය. ලංකා සම සමාජ පක්ෂය ආරම්භ කිරීමේ දී ඒ සඳහා මුල්වූ නායකයකු මෙන්ම වැවිලිකරුවකු හා 1935 සිට 1939 දක්වා එහි භාණ්ඩාගාරික ලෙස කටයුතු කළ රෙජිනෝල්ඩ් එස්. සේනානායක මහතාගේ බිරිඳ වූයේ ඇයයි. සම සමාජ නායකයන් බෝගම්බර සිරගෙදරින් මුදා ගනිමින් ඉන්දියාවට යැවීමේ රහස් මෙහෙයුම තුළත් රෙජී සහ ෆ්ලොරන්ස් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකර ඇත.

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පළමුවැනි සහ දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභාවන්ට වඩා වෙනස් එකක් වූයේ සර්වජන ඡන්ද බලය ලැබූ නිසා පමණක් නොවේ. එතෙක් මන්ත්‍රණ සභාවලට නිතරඟයෙන් පත්වූ බණ්ඩාරනායක හා සේනානායක වැනි දේශපාලනයේ නම් දැරූවන්ටද මේ සමඟ ප්‍රතිවාදී අපේක්ෂකයන් සමඟ මැතිවරණ තරඟ බිමෙහි ගැටෙන්නට සිදුව තිබීම හේතුවෙනි. මෙම තත්ත්වය යටතේ, සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ප්‍රථම ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරියෝ තිදෙනෙක් වූහ.

ෆ්ලොරන්ස් සේනානායක ලංකා සම සමාජ පක්ෂයෙන් කිරිඇල්ල අසුනට තරඟ කරද්දී, ශ්‍රීමතී අභයගුණවර්ධන අම්බලන්ගොඩ - බලපිටිය අසුනට තරඟකර තිබෙන්නේ ලංකා කොමියුනිස්ට් පක්ෂයෙනි.එම මැතිවරණය සඳහා ස්වාධීන අපේක්ෂිකාවක් ලෙස මැද කොළඹ අසුනට තරඟ කළ අයේෂා රාවුෆ් සිය විවාහයෙන් අනතුරුව ලංකාවට සංක්‍රමණය වූ කාන්තාවක් වූ අතර, ලංකාවේ මුස්ලිම් දැරියන්ගේ අධ්‍යාපනය නංවාලීමට පුරෝගාමී වූ ඇය, මුස්ලිම් කාන්තා විද්‍යාලයේ නිර්මාතෘවරියයි.

සමසමාජ පක්ෂය නියෝජනය කළ ෆ්ලොරන්ස් 1947 ප්‍රථම මැතිවරණයේදී අංක 86 - කිරිඇල්ල ආසනයට තේරී පත්වූයේ මුළු ඡන්ද 5535ක් ද, වැඩි ඡන්ද 2241ක් ද හිමිකර ගනිමිනි. අපේක්ෂකයන් හයදෙනකු තරඟවැදි මෙම මැතිවරණයේදී දෙවන ස්ථානයට පත්වූ ටී. කේ. ඩබ්ලිව්. චන්ද්‍රසේකර මහතාට හිමිවූයේ ඡන්ද 3294 ක් පමණකි. ඇය හා මැතිවරණ තරඟ බිමට අවතීර්ණ වූ අනෙකුත් තරගකරුවන් වූයේ, ඒ. ඊ. බී. කිරිඇල්ල, එච්. ඒ. ජී. කලටුවාව, බී. ඇස්. රාමචන්ද්‍ර, ඒ. ඇම්. ඇස්. ඇල්. පතනිමුහන්දිරම් ආදීහුය. ඇය 1947 පළමු පාර්ලිමේන්තුවේ ඡන්දයෙන් පත්වූ මහජන මන්ත්‍රීවරුන් අනූපස් දෙනා අතර සිටි එකම කාන්තාව බවටත් පත්වූවාය.

1947 පාර්ලිමේන්තුව නියෝජනය කළ එවක සම සමාජ පක්ෂයේ සිටි පිලිප් ගුණවර්ධන වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් හේතුවෙන් සිරගත කරනු ලැබීම නිසා හිස් වූ අවිස්සාවේල්ල ආසනය සඳහා ලංකා සම සමාජ පක්ෂයෙන් ඉදිරිපත් කරන ලද පිලිප්ගේ බිරිඳ, කුසුමා ගුණවර්ධන, නිතරගයෙන්ම පාර්ලිමේන්තුවට පත් වූ අතර ඒ අනුව ඇය සෝල්බරි පාර්ලිමේන්තුවට පත්වූ දෙවැනි මන්ත්‍රීවරිය බවට පත්වූවාය. එම පාර්ලිමේන්තුවේ පළමු මන්ත්‍රීවරිය ෆ්ලොරන්ස් මෙන්ම දෙවැනි මන්ත්‍රීවරිය වූ කුසුමා ද ලංකා සම සමාජ පක්ෂයේ අපේක්ෂිකාවන් වීම විශේෂත්වයකි.

පළමු මැතිවරණයේදී කිරිඇල්ල ආසනය ජයගත් ෆ්ලොරන්ස් සේනානායක මහත්මියට දෙවන වර ලබාගත හැකි වූයේ ඡන්ද 31192 ක් පමණි. මේ අනුව ඒ. ඊ. බී. කිරිඇල්ල මහතා වැඩි ඡන්ද 2609න් කිරිඇල්ල අසනය ජය ගැනීමට සමත් විය.


ඉන්පසු එළඹි සෑම මැතිවරණයකටම විවිධ දේශපාලන ධාරා නියෝජනය කරමින් මෙරට කාන්තාවන් පාර්ලිමේන්තුවට, නගර සභාවලට සහ පසුව පළාත් සභාවට තේරී පත් වූහ. මෙසේ ශ්‍රී ලාංකීය දේශපාලනයේ පුරෝගාමී මෙහෙවරක යෙදුණු ඩේසි මාරියා ෆ්ලෝරන්ස් සේනානායක 1988 දෙසැම්බර් 03 වන දින වයස අවුරුදු 85න් මෙලොව හැර ගියේ මෙරට සෙසු කාන්තාවන්ට පූර්වාදර්ශයක් වෙමිනි.

වාමාංශික අසුන රැකගත් **කුසුමා ගුණවර්ධන මැතිනියගේ** ජීවන තතු පිළිබඳ ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.

*ඉෂාරා වික්‍රමසිංහ*
*මහජන සේවා නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

විශේෂාංග

# අපේ කථානායක පරපුර



පසුගියදා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ලෙස පත් කර ගැනුණු මහින්ද යාපා අබේවර්ධන මහතා මෙරට කථානායක නාමාවලියට එක්වන්නේ එකොළොස්වැනි කථානායකවරයා ලෙසිනි. එතුමන් ගරු කථානායකතුමන් ලෙස තෝරාගැනීම සිදු වූයේ නිතරගයෙනි.

පාර්ලිමේන්තුවක මුලසුන වන කථානායක තනතුරෙහි ඉතිහාසයද පාර්ලිමේන්තුව තරම්ම පැරණිය. කථානායකවරයාට සම්බන්ධ බ්‍රිතාන්‍ය සාම්ප්‍රදායානුකූල ඉතිහාස කථාව අනුව රජු හා සාමාන්‍ය පුරවැසියන් අතර සන්නිවේදනය පිණිස එම ධුරය බිහිව තිබෙන අතර එය කිසිවිටෙක පහසු රාජකාරියක් වී නොමැත. පාර්ලිමේන්තුවෙහි ගරු කථානායකතුමන්ගේ කාර්යභාරය තෙවදෑරුම් වෙයි. ඒ පටිපාටිමය, පරිපාලනමය හා නියෝජිතාත්මක වශයෙනි. පටිපාටිමය කාර්යභාරය අනුව, කවුරුත් දන්නා පරිදි ඔහු සභාවේ පූර්ණ සැසිවාරයේදී මුලසුන හොබවන්නේය. එමෙන්ම, ආණ්ඩු පක්ෂ - විපක්ෂ මන්ත්‍රීවරුන් හඳුනාගෙන ඊළඟ කථාවාරය තීරණය කරයි. ස්ථාවර නියෝග, පාර්ලිමේන්තු සම්ප්‍රදාය හා රීතීන්ට අනුකූලව සභාවෙහි කටයුතු පවත්වාගෙන යයි. දෙපාර්ශවයේ ඉල්ලීම් තුලනය කරමින් මන්ත්‍රීවරයන්ගේ අයෝග්‍ය චර්යාවන් පාලනය කර, සභාගැබෙහි විනීතභාවය ආරක්ෂා කරන්නට මැදිහත් කාර්යභාරයක් ඉටු කරයි. ස්ථාවර නියෝග අර්ථ නිරූපණය වන්නේ ද කථානායකගේ තීරණ පරිද්දෙනි. සභාගර්භයේ පැවැත්වෙන විවාද සඳහා ඔහු සහභාගී නොවේ.

ශ්‍රී ලංකාවේ කථානායක නාමාවලියෙහි ප්‍රථම කථානායකවරයා වශයෙන් ශ්‍රීමත් ෆ්‍රැන්සිස් මොලමුරේ මැතිතුමා ඉතිහාසගත වන අතර ඔහු 1931 ජූලි මස 07 වැනි දින සිට 1934 දෙසැම්බර් 10 වැනි දින තෙක් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ද, 1947 ඔක්තෝබර් 14 වැනි දින සිට 1951 ජනවාරි 25 වැනි දින තෙක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේද කථානායක ධුරය හොබවා ඇත. ඒ අනුව ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිට දෙවන ජාතික රාජ්‍ය සභාව දක්වා මෙරට ව්‍යවස්ථාදායකය තුළ කථානායකවරු පහළොස්දෙනෙකු කථානායක ධුර හොබවා ඇත.

1978 දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමඟ, ප්‍රථම පාර්ලිමේන්තුවේ කථානායකවරයා වූයේ, පාර්ලිමේන්තු මන්ත්‍රී, ආචාර්ය ආනන්ද තිස්ස ද අල්විස් මහතා ය. ඔහු 1978 සැප්තැම්බර් 07 සිට සැප්තැම්බර් 13 වැනි දින තෙක් කථානායක ධුරය හෙබවීය. ඔහුගෙන් පසුව, පළමු පාර්ලිමේන්තුවේ දෙවන කථානායක වශයෙන් එම්. ඒ. බාකීර් මාකර් මහතා 1978 සැප්තැම්බර් 21 සිට 1983 අගෝස්තු මස 30 දින තෙක් කටයුතු කළේය. 1983 සැප්තැම්බර් 06 වන දින සිට 1988 දෙසැම්බර් 20 දක්වා ඊ. එල්. සේනානායක මහතා තෙවැනි කථානායක ධුරය හොබවා ඇත. ඒ අනුව පළමු පාර්ලිමේන්තුවේදී කථානායකවරු තිදෙනෙකු එම ධුරය හොබවා ඇත.

ශ්‍රී ලංකාවේ දෙවන පාර්ලිමේන්තුවේ දී එම්. එච්. මොහොමඩ් මහතා සිවුවන කථානායකවරයා ලෙස වර්ෂ 1989 මාර්තු 09 සිට 1994 ජූනි 24 දක්වා කටයුතු කළේය. කේ.බී.රත්නායක මහතා තෙවෙනි ලංකා පාර්ලිමේන්තුවේ දී පස්වැනි කථානායකවරයා ලෙස තෝරා ගැනුණේය. 1994 අගෝස්තු 25 සිට 2000 අගෝස්තු 18 දක්වා කාලයෙහි ඔහු මෙම ධුරය දැරූ අතර නැවතත් 2000 සැප්තැම්බර් 14 සිට එම වසරේ ඔක්තෝබර් 10 දක්වා දෙවෙනි ධුර කාලය හොබවා ඇත. අනුර බණ්ඩාරනායක මහතා සිව්වන ලංකා පාර්ලිමේන්තුවේ දී සයවෙනි කථානායක ලෙස 2000 ඔක්තෝම්බර් 18 සිට 2001 ඔක්තෝබර් 10 දක්වා වසරකට ආසන්න කලක් කටයුතු කළේය.

ඉන්පසුව පස්වන ලංකා පාර්ලිමේන්තු සමයේ දී හත්වැනි කථානායක ධුරයට පත් වූ ජෝශප් මයිකල් පෙරේරා මහතා 2001 දෙසැම්බර් 19 සිට 2004 පෙබරවාරි 07 දක්වා එම ධුරයෙහි කටයුතු කරනු ලැබීය.

හයවන ලංකා පාර්ලිමේන්තුවේ දී අටවැනි කථානායකවරයා ලෙස වි. ජ. මු. ලොකුබණ්ඩාර මහතා පත්වූයේ තරමක් වෙනස් ලෙසිනි. රහස් ඡන්ද විමසීම වට තුනක් දක්වා ඇදීගිය අතර එය පාර්ලිමේන්තු ඉතිහාසයේ එන දීර්ඝතම කාලයක් වැය කළ කථානායක තෝරාගැනීමේ ඡන්ද විමසීම ලෙස සැලකේ. 2004 අප්‍රේල් මස 22 සිට 2010 පෙබරවාරි 09 දක්වා ද, 2010 මාර්තු මස 09 වැනි දින සිට අප්‍රේල් මස 20 දක්වා ද හෙතෙම එම ධුරය හෙබවීය.

චමල් රාජපක්ෂ මහතා ශ්‍රී ලංකාවේ නවවැනි කථානායකවරයා ලෙස හත්වැනි පාර්ලිමේන්තුවේ දී කටයුතු කර ඇත. 2010 අප්‍රේල් 22 සිට 2015 ජූනි 26 දක්වා දිගු කලක් හෙතෙම කථානායක ධුරය දැරුවේය. අවසන් වශයෙන් ශ්‍රී ලංකා අටවන පාර්ලිමේන්තුවේ දසවැනි කථානායකවරයා ලෙස පත්වූයේ දේශබන්දු කරු ජයසූරිය මහතාය. හෙතෙම 2015 සැප්තැම්බර් මස 01 වැනි දින සිට 2020 මහා මැතිවරණය අවසන්ව, අටවැනි පාර්ලිමේන්තුව නිමවන තෙක් ජයසූරිය මහතා එම ධුරය හෙබවීය.

***නිපුනි බලගමගේ***
***මහජන සේවා නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

# පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතා රජයේ මුදල් කාරක සභාවේ සභාපති ධුරයට



නව වැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේ කටයුතු කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 18 දෙනෙකුගෙන් සමන්විත රජයේ මුදල් කාරක සභාව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් නම් කරන ලදී.

එහි සභාපතිත්වය පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතාට හිමිව තිබේ. 1994 වසරේ දී පළමු වරට පාර්ලිමේන්තුවට තේරී පත් වන හෙතෙම කොළඹ නාලන්දා විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකි. වෘත්තියෙන් නීතිඥයෙකු වන අනුර ප්‍රියදර්ශන යාපා මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම්වරයා ලෙස ද කලක් කටයුතු කළේය. බලශක්ති අමාත්‍යවරයා ලෙස ද, ආපදා කළමණාකරණ අමාත්‍යවරයා ලෙස ද ඒ මහතා කටයුතු කර තිබේ.

ආචාර්ය බන්දුල ගුණවර්ධන, කෙහෙළිය රඹුක්වැල්ල, සුසිල් ප්‍රේමජයන්ත, විදුර වික්‍රමනායක, ආචාර්ය සරත් වීරසේකර, ඩී. වී. චානක, ආචාර්ය නාලක ගොඩහේවා යන අමාත්‍යවරු ද, අනුර ප්‍රියදර්ශන යාපා, විජිත හේරත්, ඩිලාන් පෙරේරා, ආචාර්ය හර්ෂ ද සිල්වා, එම්. ඒ. සුමන්තිරන්, චමින්ද විජේසිරි, හේෂා විතානගේ, ඉසුරු දොඩන්ගොඩ, සහන් ප්‍රදීප් සහ මහාචාර්ය රංජිත් බණ්ඩාර සහ අනුප පැස්කුවල් යන මන්ත්‍රීවරු ද මුදල් කාරක සභාවට අයත් වෙති.



විශේෂාංග

# ඉටිපන්දම් එළියෙන් පාර්ලිමේන්තුව රැස්ව දස වසරයි



1992 ජූනි මස 05 වන දින පළමු වරට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ගංවතුරට යටවූ අතර 2010 නොවැම්බර් මස 11 වන දින නැවතත් පාර්ලිමේන්තුව ජලයෙන් යට විය.


2010/11/10 වන දින රාත්‍රියේ ඇරඹුණු මහ වර්ෂාව පසුදා උදෑසන තෙක් මුළු බස්නාහිර පළාතටම නොකඩවා ඇඳ හැළුණේය. එසේ වුවද 11 වන බ්‍රහස්පතින්දා දින පාර්ලිමේන්තු දිනයක් වූ බැවින් කාර්ය මණ්ඩලය සුපුරුදු පරිදි සේවය සඳහා වාර්තා කළ යුතු විය.

එදින උදෑසන 4.30ට පමණ පාර්ලිමේන්තුව ජලයෙන් යටවෙමින් පවතින බව පාර්ලිමේන්තු පොලීසිය විසින් වේත්‍රධාරිතුමන් වූ අනිල් පරාක්‍රම සමරසේකර මහතා වෙත දැනුම් දී තිබිණි. පාර්ලිමේන්තු පරිශ්‍රය වේත්‍රධාරීවරයා සිය කාර්ය මණ්ඩලය සමඟ එක්ව, අදාළ අංශ දැනුවත් කරමින් යුහුසුලුව කටයුතු කරමින් සිටියේය.


ඈත සිට අපට පෙනුණේ, දියවන්නා ඔය එක් විශාල ජලාශයක් ලෙස සහ පාර්ලිමේන්තුව ඒ මධ්‍යයේ නැගී සිටින දූපතක් ලෙසිනි. දියවන්නාවේ සැඩ දිය පහර රළ ගසන්නාක් මෙන් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලෙහි හැපෙයි. පිටත දර්ශනය චමත්කාරජනක වුව ගොඩනැගිල්ලේ බිම් මහල සහ කමිටු කාමර ජලයෙන් යටවී ඇති බව නිසැකය. බෝට්ටුවලින්, යුධ හමුදා බෆල් රථ හා යුනිසෙෆ් ආයතනයේ ජීප් රථ වලින් ඇතුළට පැමිණි අප දුටුවේ, පාර්ලිමේන්තුව තුළ කමිටු කාමර 01 සහ 02 ජලයෙන් උතුරා යන ආකාරයයි. එහි වූ මිලැති බුමුතුරුණු, කාර්යාලයීය පුටු, මේස සහ ශ්‍රව්‍ය උපකරණ පද්ධතියද ජලයට යටවී හමාරය.

බෝට්ටු මඟින් පාර්ලිමේන්තුව වෙත ළඟා වූ එවකට මහලේකම් ධම්මික කිතුල්ගොඩ, නියෝජ්‍ය මහලේකම් ධම්මික දසනායක, සහකාර මහලේකම් නීල් ඉද්දවල වැනි ප්‍රමුඛතම පාර්ලිමේන්තු නිලධාරීන් මෙන්ම රැස්ව සිටි කාර්ය මණ්ඩලයේ සියල්ලන්ගේම මුහුණුවල පිළිබිඹු වන්නේ කනගාටුවකි.

අනතුරුව, එවකට කතානායක තැන්පත් ගරු චමල් රාජපක්ෂ මහතා පවා පාර්ලිමේන්තු ගොඩනැගිල්ල කරා ප්‍රවේශ වූයේ බෝට්ටුවක නැගී දියවන්නාවේ උස් ජලකඳ තරණය කරමිනි. කථානායකතුමන් විසින් කවර බාධා තිබුණද පාර්ලිමේන්තුවේ රැස්වීම් කටයුතු සම්ප්‍රදායානුකූලව සිදුකිරීමට තීරණය කර තිබිණ. එසේ වුවද පාර්ලිමේන්තුවේ විදුලි බලය විසන්ධි වීම නිසා, අපර භාග 1.00 ට පාර්ලිමේන්තුව රැස්ව අපර







භාග 1.08 ට එදින කටයුතු අවසන් කර 2010 නොවැම්බර් 16 වන අඟහරුවාදා පූර්ව භාග 9.30 වන තෙක් කල් ගියේය. එදින විනාඩි අටක කාලයකට සීමා වූ පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වූයේ ඉටිපන්දම් ආලෝකයෙනි. මෙරට පාර්ලිමේන්තු ඉතිහාසයේ විදුලි බලය නොතිබූ අවස්ථාවක පාර්ලිමේන්තුව රැස්වූ ප්‍රථම සහ එකම අවස්ථාව එයයි. මෙම පාර්ලිමේන්තු රැස්වීමට මන්ත්‍රීවරුන් 31දෙනෙකු සහභාගී වූහ. එදින රුපියල් බිලියන පහලොවක පරිපූරක ඇස්තිමේන්තුව හා විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියෝග තුනක් හා නිෂ්පාදන බදු පනත යටතේ නියමයන් සභා සම්මත විය.

පිටත සිට බොහෝ දෙනා පුරෝකථනය කළ පරිදිම, පාර්ලිමේන්තු කාර්යාලයීය ලිපි ගොනු ගංවතුරට හසු ව තිබුණි. එසේ වුවද, පරිගණක පද්ධතිය ආරක්ෂා වීම නිසා අත්‍යවශ්‍ය සියලු දත්ත සුරක්ෂිත වීම සියලු දෙනා හට අස්වැසිල්ලක් විය.

පාර්ලිමේන්තු පරිශ්‍රයෙහි මහජන භෝජනාගාරය ජලයෙන් යටවී තිබුණු නිසා එහි තිබුණු බඩු බාහිරාදිය විනාශව තිබුණි. එසේම, පාර්ලිමේන්තු රථගාලෙහි තිබූ වාහනද රියදුරන් විසින් ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාමට කඩිනමින් කටයුතු කරන ලදි.

අනාගත පාර්ලිමේන්තුව මෙවැනි ස්වභාවික ආපදා තත්ත්වයන්ට ගොදුරු වීම වැළැක්වීමට දියවන්නාව ගැඹුරු කිරීම ඇතුළු තීරණ රැසක් පසුව ක්‍රියාත්මක කෙරිණි.

පාර්ලිමේන්තුවේ ජල මට්ටම දින පහකින් පමණ අනුක්‍රමයෙන් අඩුවී ගිය අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සුපුරුදු තත්ත්වයට පත් කිරීමෙහිලා ඉමහත් පරිශ්‍රමයක් දැරුවේ මහලේකම්තුමන් පටන් අපගේම කාර්ය මණ්ඩලය බව මෙහිදී ගෞරවයෙන් සිහිපත් කරන්නේ අනාගතයටත් අපට ඒ එකමුතුකම සවියක් බැවිනි.

*ජී. ජේ. රොද්‍රිගෝ*
*මහජන සේවා සම්බන්ධීකාරක*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*













# 2020 ඇමරිකානු ජනපති සටන

දිනය 2020 නොවැම්බර් 04 වැනිදාය. ලොව බොහෝ රට වල අවධානය යොමු වී තිබුණේ ඇමරිකා එක්සත් ජනපදය දෙසටයි. ඇමරිකා එක්සත් ජනපදය මීළඟ වසර 4 පාලනය කරන ජනපතිවරයා තෝරාගන්නා මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් වෙමින් පැවතීම ඊට හේතුව විය. මේ පත්වන ජනාධිපතිවරයා එක්සත් ජනපදයට පමණක් නොව ලෝකයටම බලපෑමක් ඇතිකරන පුද්ගලයෙකු වන බැවින් මෙසේ ලෝකයේම අවධානය ඇමරිකාව දෙසට යොමු වී තිබුණි.

ඇමරිකාවේ වර්තමාන ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් රිපබ්ලිකන් පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වූ අතර ජෝ බයිඩන් ඩිමොක්‍රටික් පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා විය. දෙදෙනාගෙන් එක් අයෙකු මීළඟ වසර 4 පාලනය කරන ජනාධිපති වරයා වීමට එරට මැතිවරණ ඒකක වන ඡන්ද විද්‍යාල 270 සීමාව පසු කළයුතු විය.

එක්සත් ජනපදයේ ඡන්ද විද්‍යාල 538 ක් පවතී. එරට ජනාධිපතිවරයා ලෙස පත්වන්නේ ජනතාවගේ සෘජු ඡන්දයෙන් වැඩිම ඡන්ද ලබාගන්නා අපේක්ෂකයා නොවේ. මෙම ඡන්ද විද්‍යාල 538 අතුරින් හරි අඩකට වඩා එනම් ඡන්ද විද්‍යාල 270 ඉක්මවන අපේක්ෂකයායි. මේ අනුව එක්සත් ජනපදයේ අවස්ථා කිහිපයකදීම වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබාගත් අපේක්ෂකයින් පරදවමින් වැඩි ඡන්ද විද්‍යාල ප්‍රමාණයක් ලබාගත් අපේක්ෂකයින් ජයග්‍රහණය කොට තිබේ. නිදසුනක් ලෙස පසුගිය 2016 ඇමරිකානු ජනාධිපතිවරණයේ වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබාගත්තේ ඩිමොක්‍රටික් අපේක්ෂක හිලරි ක්ලින්ටන් මහත්මියයි. නමුත් එවර ජනාධිපතිවරණය ජයග්‍රහණය කළේ ඡන්ද විද්‍යාල වැඩි ප්‍රමාණයක ජය තහවුරු කරගත් ඩොනල්ඩ් ට්‍රම්ප් මහතාය.

ඇමරිකාව ප්‍රාන්ත 50 කින් සමන්විත සන්ධිය රාජ්‍යයකි. භූමි ප්‍රමාණය, ජනගහනය යන කාරණා සම්බන්ධයෙන් වෙනස්කම් පැවතියද එරට ව්‍යවස්ථාවෙන්ම සෑම ප්‍රාන්තයකටම සමාන පිළිගැනීමක් ලබා දී තිබේ. මේ නිසා සන්ධීය ක්‍රමය තුළ ප්‍රාන්ත බලවත් කිරීමටත්, ජනාධිපතිවරයාට ප්‍රාන්ත නොසලකා කටයුතු කිරීමේ අවස්ථාව අඩු කිරීමටත් ඡන්ද විද්‍යාල ක්‍රමයක් හරහා එරට ජනාධිපතිවරයා පත් වෙයි. ඒ ඒ ප්‍රාන්තයට හිමිවන ඡන්ද විද්‍යාල සංඛ්‍යාව එම ප්‍රාන්තයේ භූමි ප්‍රමාණය, ජන සංඛ්‍යාව සහ තවත් සාධක මත තීරණය වෙයි.

සෑම ජනපතිවරණයකදීම අපේක්ෂකයන්ගේ වැඩි අවධාවයක් යොමුවන ප්‍රාන්ත කිහිපයක් එක්සත් ජනපදයේ වෙයි. කැලිෆෝනියා, ටෙක්සාස්, ෆ්ලොරීඩා, නිව්යෝර්ක්, පෙන්සිල්වේනියා ඒ අතරින් ප්‍රමුඛ තැනක් ගනී. මෙම ප්‍රාන්තවල ඡන්ද විද්‍යාල ප්‍රමාණය අනෙක් ප්‍රාන්ත වලට වඩා වැඩි වීම ඊට හේතුවයි. කැලිෆෝනියාව සතුව ඡන්ද විද්‍යාල 55ක්ද, ටෙක්සාස් සතුව ඡන්ද විද්‍යාල 38ක්ද, ෆ්ලොරීඩා සතුව ඡන්ද විද්‍යාල 29ක්ද, නිව්යෝර්ක් සතුව ඡන්ද විද්‍යාල 29ක්ද, පෙන්සිල්වේනියා සතුව ඡන්ද විද්‍යාල 20ක්ද, පවතින බැවින් මෙම ප්‍රාන්ත ජයගන්නා අපේක්ෂකයින්ට ජනාධිපතිවරයා වීම ඉතා පහසු විය. මේ නිසා මෙවර මැතිවරණයේදීද බයිඩන් සහ ට්‍රම්ප් යන අපේක්ෂකයන් දෙදෙනා අතරම මෙම ප්‍රාන්ත ජයග්‍රහණය කිරීම සඳහා වැඩි උනන්දුවක් යොමු වී තිබුණි.

එසේම එරට සෙනෙට් මණ්ඩලය සාමාජිකයින් 100කින් සහ කොංග්‍රස් මණ්ඩලය සාමාජිකයින් 435 කින් සමන්විත වූ අතර පත්වන ජනාධිපතිවරයාට සෘජුව පාලනය මෙහෙයවීම සඳහා මේවායේ බහුතර බලයක් හිමිවීම වැදගත් සාධකයක් විය. මේ සඳහාද මෙම ප්‍රාන්ත කිහිපයේ ජයග්‍රහණය තීරණාත්මක සාධකයක් විය.

මෙම ප්‍රාන්ත අතුරින් පසුගිය 2016 ජනාධිපතිවරණයේ රිපබ්ලිකන් අපේක්ෂක ඩොනල්ඩ් ට්‍රම්ප් ජයග්‍රහණය කළ පෙන්සිල්වේනියා (20) ප්‍රාන්තය මෙවර මැතිවරණයේදී ජෝ බයිඩන් ජයගෙන තිබීමද විශේෂත්වයක් විය.

කෙසේ නමුත් මැතිවරණයේ සමස්ත ප්‍රතිඵල අනුව ජෝ බයිඩන් ඡන්ද විද්‍යාල 306ක බලය ලබාගත් අතර ඡන්ද මිලියන 80 ඉක්මවමින් ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 51% ප්‍රතිශතයක් ඉක්මවා තිබුණි. නමුත් වත්මන් ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තහවුරු කරගෙන තිබුණේ ඡන්ද විද්‍යාල 232ක බලය පමණක් වූ අතර ඔහු ඡන්ද මිලියන 73 ඉක්මවමින් ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 47 % පමණ ප්‍රතිශතයක් ලබාගෙන තිබුණි.

සෑම වසර 4කට වරක්ම ඇමරිකාවේ ජනාධිපතිවරණය පැවැත්වෙන අතර සිව්වන වසරේ නොවැම්බර් මාසයේ පළමු සඳුදාට පසු එළඹෙන අඟහරුවාදා මැතිවරණය පැවැත්විය යුතු බව එරට ව්‍යවස්ථාවේ සඳහන් වී තිබේ. නමුත් මෙවර ලෝකයටම බලපෑ වසංගතයක් වන කොවිඩ් 19 වසංගතය හමුවේ ඇමරිකාව දැඩි පීඩාවට පත්වී සිටි පසුබිමක වුවද වර්තමාන ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඉතා සෘජු තීරණයක සිටිමින් නියමිත දිනට මැතිවරණය පැවැත්වීමට තීරණය කොට තිබුණි. මේ නිසා ව්‍යවස්ථාවට අනුව මේ වසරේද නිවැරදි දිනය වන නොවැම්බර් 03 වන අඟහරුවාදා මැතිවරණය පැවැත්වුණි. ඒ අනුව මැතිවරණයෙන් පසු ජයග්‍රාහී අපේක්ෂකයා මීලඟ වසර 04 සඳහා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දීම ව්‍යවස්ථාවට අනුව ජනවාරි 20 දිනට නියමිතව තිබේ.

ඩිමොක්‍රටික් අපේක්ෂක ජෝ බයිඩන් ඡන්ද විද්‍යාල 270 සීමාව පසුකර ඇති නිසා වත්මන් ජනපති ඩොනල්ඩ් ට්‍රම්ප් පරාජය කරමින් ඇමරිකා එක්සත් ජනපදයේ මීළඟ ජනාධිපතිවරයා වන බව මේ වන විට පැහැදිලිව පෙනෙන්නට තිබේ. මේ පිළිබඳ නිවැරදි තීරණය දෙසැම්බර් 14 දින ඡන්ද විද්‍යාල නියෝජිතයින් එක්ව තීරණය කරන බව පැවසේ. එය එසේ වුවහොත් ඇමරිකාවේ ජනාධිපතිවරයාව සිටින අතරතුර දෙවනවර ජනාධිපතිවරණයට ඉදිරිපත්වී පරාජයට පත්වූ ඇමරිකානු ජනාධිපතිවරුන් අතළොස්ස අතරට ඩොනල්ඩ් ට්‍රම්ප් මහතාගේ නමද එක්වෙනු ඇත.

සාමාන්‍යයෙන් ඇමරිකානු මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීම 60% ක පමණ සීමාවක පැවති අතර මෙවර ආසන්න වශයෙන් 66% ක් ඡන්දය සඳහා දායක වී තිබීම විශේෂත්වයකි. එසේම ඡන්ද දායකයින් වැඩි පිරිසක් මැතිවරණ දිනයට පෙර ඡන්දය ප්‍රකාශ කර තිබීම ද විශේෂත්වයකි.

*ආසිරි හපුගොඩ*
*මාධ්‍ය නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

**කර්තෘ මණ්ඩලය**

*උපදේශනය*

ධම්මික දසනායක මහතා (පාර්ලිමේන්තු මහලේකම්)
නීල් ඉද්දවල මහතා (නියෝජ්‍ය මහලේකම් හා කාර්ය මණ්ඩලයේ ප්‍රධානී)
කුෂාණි රෝහණධීර මහත්මිය (සහකාර මහලේකම්)
ටිකිරි කේ. ජයතිලක මහතා (සහකාර මහලේකම්)

*සංකල්පය හා මඟපෙන්වීම*

ශාන් විජේතුංග මහතා

*ප්‍රධාන සංස්කරණය*

බුද්ධිනි රාමනායක මෙනෙවිය
එදිරිවීර ගුණසේකර මහතා
නිම්මි හාතියල්දේණිය මහත්මිය

*ඡායාරූපකරණය*

නුවන් දුමින්ද මහතා

*පිටු සැලසුම්කරණය*

ඉෂාරා වික්‍රමසිංහ මෙනෙවිය

*අන්තර්ජාලය හරහා බෙදාහැරීම*

වී.ජී.එම්.එම්.නුස්කි මහතා



# පාර්ලිමේන්තු ගෘහ නිර්මාණ



ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටත්වය විදහා දක්වන නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, ජෙෆ්රී බාවා, එඩ්වඩ් රීඩ් සහ බෙග් ආචාර්ය කේ.පුලෝගසුන්දරම් සහ වසන්තා ජේකොබ්සන් - චන්ද්‍රරත්න යන විශ්ව කීර්තියට පත් ශිල්පීය මඬුල්ලේ අනර්ඝ නිමැවුමකි. එම ශිල්පීන් විවිධ ජනවර්ග නියෝජනය කිරීමද තවත් එක් විශේෂත්වයක් විය.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සුවිශේෂ ගෘහ නිර්මාණ ලක්ෂණ**

ශ්‍රී ලංකාව ස්වභාවික දිවයිනක් මෙන්ම එහි ව්‍යවස්ථාදායකය පිහිටි පාර්ලිමේන්තු අංගණයද පිහිටා ඇත්තේ කෘත්‍රිම දූපතක වීම විශේෂත්වයකි. විවෘත කේන්ද්‍රීය ප්‍රධාන ශාලාවක් වටා පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පංචවාස ගෘහනිර්මාණ සැලසුම පැරණි ලාංකිකයන්ගේ ගොඩනැංවීම් වල ආභාසයෙන් නිමවා ඇත.

මෙම ගොඩනැගිල්ලේ සුවිශේෂී අංගය කාලානුරූපව හරිත පැහැයට පරිවර්තිත තඹ වහළයි. එය දකුණු ඉන්දියානු ගෘහනිර්මාණ ලක්ෂණ දරන අතර මහනුවර රාජසිංහ රජුගේ දළදා මාළිගයට මෙන්ම ලංකාතිලක විහාරයේ වහළටද සමීපකම් පෙන්වයි. පාර්ලිමේන්තුවේ ඇති වැදගත්ම ස්ථානය සභාගැබයි. ප්‍රධාන ගොඩනැගිල්ල සමචතුරස්‍රාකාර නමුත් සභා ගැබේ කූඩාරම් සිවිලිම නිසා එයට නව හැඩයක් එක්ව ඇත.

නූතන උපකරණ සහ තාක්ෂණය යොදාගනිමින් සභා ගැබෙහි ආලෝකයද, ශබ්ද පරිපාලනයද හසුරුවා ඇත. එහි දැව නිර්මාණ සඳහා සියඹලා පදම් කළ ලී යොදාගැන්ම එවකට අතිශය නූතන මාදිලියේ තෝරාගැනීමක් වූ බව නොරහසකි.

**ඝණ්ටාර යුගලය**

මෙම ගොඩනැගිල්ල නිර්මාණය කිරීමේදී ප්‍රධාන ඉදිකිරීම් සමාගම ලෙස කටයුතු කළ ජපානයේ මිට්සුයි සමාගමෙන් තිළිණ කළ ඝණ්ටාර යුගලය පාර්ලිමේන්තුව ඉදිරිපස විශේෂ උත්සව ශාලාව ආසන්නයේ පිහිටුවා ඇත. අතීත රජ දවස මහජනයාගේ දුක් ගැනවිලි රාජ සභාවට දැනුම් දීම උදෙසා රජ මාළිගාව ඉදිරිපස ඝණ්ඨාරයක් සවිකර තිබූ බව ජනප්‍රවාද තුළ සුලබව අසන්නට ලැබේ. ඒ හා සමපාත වන මෙම ඝණ්ටාර යුගලය තුළින්ද පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවද මහජනයාට සිය දුක්ගැනවිලි පවසනු පිණිස එක් රැස්ව කටයුතු කිරීමට යෝග්‍ය ස්ථානයක් බවයි.

තවද එය පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ සමබරතාවය පෙන්නුම් කිරීමට එනම්, කිසියම් අවස්ථාවක ගොඩනැගිල්ලේ එක් කොටසක් හෝ ගිලාබැසීමට ලක්වුවහොත් එය මෙම ඝණ්ටාර යුගලයේ යම් ඇලවීමක් මඟින් පෙන්නුම් කරන බවටද බොහෝදෙනා අතර විශ්වාසයක් තිබේ.

*රශ්මියා නූටාන්*
*මහජන සේවා නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*



# 'බ්‍රෙක්සිට්' පසුවිපරම

එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත්ව යාම ලෝකයේ බොහෝදෙනා හට විස්මය ගෙන දෙන්නක් විය. නමුත් එය මහා බ්‍රිතාන්‍යයේ දිගු කාලීන අභිප්‍රායක උච්චිතම ප්‍රතිඵලයක් ලෙස හඳුන්වා දිය හැකිය. අතීතයේ පටන් ප්‍රබල අධිරාජ්‍යක්ව පැවති මහා බ්‍රිතාන්‍යයයේ ස්වෛරීභාවයට යුරෝපා සංගමයේ සාමාජිකත්වය ඔස්සේ එල්ල වූ බලපෑම මූලික කොට ගෙන මෙම ඉවත්ව යාමට මං මාවත විවර කරනු ලැබීය.

යුරෝපා සංගමයෙන් ඉවත් වීම පිළිබඳ ඊට පක්ෂ හා විපක්ෂ දෙපිරිසක් සිටි බැවින් එවකට අගමැති වූ ඩේවිඩ් කැමරන් ගත් තීරණයක් මත 2016 ජූනි 23 වන දා ජනමත විචාරණයක් පැවැත්විණි. ඉන් 52%ක ජනතා බහුතර කැමැත්ත හිමි වූයේ බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීම සඳහා බැවින්, බ්‍රෙක්සිට් සඳහා විපක්ෂ වූ කැමරන්, බ්‍රෙක්සිට් ක්‍රියාවලිය නව නායකයකු යටතේ පැවැත්විය යුතු බව පවසමින් ඊට පසු දිනයේදීම සිය අගමැති ධුරයෙන් ඉල්ලා අස් විය. පසුව කොන්සර්වේටිව් පක්ෂයේ තෙරේසා මේ මහත්මිය, බ්‍රෙක්සිට් උණුසුම මැද අගමැතිනිය ලෙස පත් වූවාය. මාග්‍රට් තැචර් අගමැතිවරියට පසුව එම ධුරයට පත් වූ දෙවන කාන්තාව ඇයයි.

හතළිස් වසක් පැරණි බ්‍රිතාන්‍ය සහ යුරෝපා සංගමය අතර පැවති සම්බන්ධතාව සම්පූර්ණයෙන්ම නවතා දැමීම සඳහා බ්‍රිතාන්‍ය අගමැතිවරයා විසින් පනස් වෙනි වගන්තිය (Article 50) ක්‍රියාත්මක කරන බවට යුරෝපා සංගමයට දැනුම් දීමෙන් අනතුරුව දෙවසරක කාලයක් තුළ බ්‍රිතාන්‍යයට පූර්ණ වශයෙන් රටවල් විසි අටකින් සැදුම්ලත් දේශපාලනික සහ ආර්ථික එකමුතුවක් වන යුරෝපා සංගමයෙන් ඉවත් වීමට අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කළ හැකිය.

කෙසේ වෙතත් බ්‍රිතාන්‍යයට මෙම ඉවත් වීමේ ක්‍රියාවලිය සැපිරීම සඳහා වසර දෙකකට වැඩි කාලයක් අවැසි වන්නේ නම් ඉතිරි යුරෝපා සංගම් සාමාජික රටවල් 27 ඒ වෙනුවෙන් සිය අනුමැතිය ලබා දිය යුතුයි. යම් හේතුවක් මත එම රාජ්‍යයන් එම ක්‍රියාවලියට සිය කැමැත්ත ප්‍රකාශ නොකළහොත්, පනස් වෙනි වගන්තිය ක්‍රියාත්මක කරන බවට බ්‍රිතාන්‍ය විසින් යුරෝපා සංගමයට දැනුම් දෙනු ලැබූ දවසේ සිට වසර දෙකක් සපිරෙන දිනයේදී බ්‍රිතාන්‍ය සාමාජිකත්වය ඉබේම අහෝසි වී යනු ඇත.

ඒ අනුව 2017 මාර්තු 29 වන දින සිට 50 වන වගන්තිය ක්‍රියාත්මක කරනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2018 වර්ෂයේ නොවැම්බර් මස බ්‍රිතාන්‍යය සහ යුරෝපා සංගමය අතර බ්‍රෙක්සිට් පිළිබඳ එකඟතා ගිවිසුමක් ඇති කරගත් බවට නිවේදනය වූ අතර 2019 ජනවාරි මස 15 වන දින බ්‍රෙක්සිට් එකඟතා ගිවිසුම පිළිබඳ ඡන්ද විමසීමක් පාර්ලිමේන්තුවේදී පැවැත්විණි. එහිදී රජය ඉදිරිපත් කළ යෝජනාව ඡන්ද 432ට 202ක් ලෙස පරාජය පත් විය.

එම ගිවිසුම නැවතත් පාර්ලිමේන්තුවේ දී දෙවරක් පරාජය වීම හේතු කොට ගෙන 2019 මාර්තු මස බ්‍රෙක්සිට් සඳහා ජූනි 30 තෙක් කල් ඉල්ලා ගැනීමට රජයට සිදු වූ අතර එම කාලය 2019 ඔක්තෝබර් 31 තෙක් කාලය දිගු කරන්නට යුරෝපා සංගමය අනුමැතිය හිමි විණි.

මෙම පරාජයත් සමඟ 2019 මැයි 24 වන දින කොන්සර්වේටිව් පක්ෂ නායකත්වයෙන් හා සිය අගමැතිධුරයෙන් තෙරේසා මේ ඉවත් වන අතර අනතුරුව 2019 ජූලි මාසයේදී බොරිස් ජොන්සන් අගමැති ලෙස පත් විය.

අනපේක්ෂිත ලෙස වසර දෙකකට වඩා කල්ගත වූ යුරෝපා සංගමයෙන් ඉවත්වීමේ ක්‍රියාවලිය බොරිස් ජොන්සන් අගමැතිවරයාගේ ධුර කාලය තුළද අභියෝගාත්මක විය. 2019 සැප්තැම්බර් මාසයේදී තමන් විසින් ගෙන එනු ලැබූ බ්‍රෙක්සිට් යෝජනාවලියට පාර්ලිමේන්තු අනුමැතිය නොලැබෙන බව අවබෝධ කරගත් ජොන්සන්, පාර්ලිමේන්තුව කල් තබන ලෙස රැජිනට දන්වා සිටිය අතර ඔහුගේ එම ඉල්ලීම එක්සත් රාජධානි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ව්‍යවස්ථා විරෝධී බව තීන්දු කරමින් නිෂ්ප්‍රභා කරවිය.

ඒ අනුව බ්‍රෙක්සිට් ක්‍රියාවලිය සඳහා ජනවාරි 31 තෙක් කාලය දිගු කරන්නට යුරෝපා සංගමයෙන් ඉල්ලීමක් කරන්නට ජොන්සන් ඇතුළු රජයට සිදු වූ අතර 2019 ඔක්තෝබර් මස සිය රජය යුරෝපා සංගමය අතර බ්‍රෙක්සිට් පිළිබඳ නව එකඟතා ගිවිසුම පිළිබඳ නිවේදනය කිරීමෙන් අනතුරුව 2019 දෙසැම්බර් 12 පැවති මැතිවරණයෙන් විශිෂ්ට ජයක් ලබා ගැනීමට ඔහු සමත් විය.

ඒ අනුව 2020 ජනවාරි 30 වන දින බ්‍රෙක්සිට් ගිවිසුම යුරෝපා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිණි. මෙලෙස දිගු ක්‍රියාවලියකට පසු යුරෝපා සංගමයේ සාමාජිකයකුව සිට ඉන් ඉවත් වූ පළමු රට බවට බ්‍රිතාන්‍යය ඉතිහාසයට එක්විය.

*මාධවී රංගේබණ්ඩාර*
*මාධ්‍ය නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

# නිලධර චිත්ති



**මහේෂ් පෙරේරා මහතා**
අධ්‍යක්ෂ
තොරතුරු පද්ධති සහ කළමනාකරණය
දෙපාර්තමේන්තුව

පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ මහේෂ් පෙරේරා මහතා රුසියානු රාජ්‍ය විශ්වවිද්‍යාලයෙන් පරිගණක ඉංජිනේරු උපාධිය හිමිකරගෙන තිබේ. ඔහු මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධිධාරියෙකි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මේජර්වරයෙකු ලෙස වසර 08 හමාරක කාලයක් සේවය කර ඇත. ඔහු 2004 වසරේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට එක්වන්නේ තොරතුරු පද්ධති සහ කළමනාකරණය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා ලෙසිනි.

ශ්‍රී ලංකා පරිගණක සංගමයේ සභාපතිවරයා ලෙස වසර 02ක කාලයක්ද, සාමාජිකයෙකු ලෙස වසර 04 ක කාලයක්ද ඒ මහතා සේවය කර ඇත.



**ලලිත් අධිකාරි මහතා**
සම්බන්ධිකරණ ඉංජිනේරු
සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ගම්පහ සිරිකුරුස විද්‍යාලයෙන්, ගම්පහ බණ්ඩාරවත්ත මහා විද්‍යාලයෙන් සහ ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ ලලිත් අධිකාරි මහතා 1992 වසරේ දී මොරටුව විශ්වවිද්‍යාලයට පිවිසියේය.

එම විශ්වවිද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ හෙතෙම වරලත් ඉංජිනේරුවරයෙක් වෙයි. අධිකාරි මහතා 1996 වසරේ සිට 2002 වසර දක්වා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සැලසුම් අංශයේ ඉංජිනේරුවරයෙක් ලෙස ද සේවය කර තිබේ.

2002 වසරේ දී නියෝජ්‍ය සම්බන්ධිකරණ ඉංජිනේරුවරයා ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පිවිසෙන ඔහු වර්තමානයේ එහි සම්බන්ධිකරණ ඉංජිනේරුවරයා ලෙස සේවය කරයි.



**රාජ් හසන්ත එදිරිසිංහ මහතා**
අධ්‍යක්ෂ
ආහාරපාන හා ගෘහපාලන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ආහාරපාන සහ ගෘහපාලන දෙපාර්තමේන්තුවේ වත්මන් අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන රාජ් හසන්ත එදිරිසිංහ මහතා 2018 වසරේදි එම තනතුරට පත්විය. පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍යයෙක් වන ඒ මහතා ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමාධාරයෙකු වේ. ඔහු 1998 වසරේදී සිය වෘත්තීය දිවිය ආරම්භ කළ අතර දෙස් විදෙස් තරු පන්ති හෝටල් රැසක කළමනාකරණ අත්දැකීම් සපුරාලුවෙකි.

වෘත්තිය ජීවිතය තුළ ඔහු ලබාගත් සුවිශේෂී ජයග්‍රහණ අතර 2007 වසරේදී ශ්‍රී ලංකා සූපවේදීන්ගේ සංගමය විසින් පවත්වන ලද සූපශාස්ත්‍ර තරගයේදී පදක්කම්ලාභිකු බවට පත්වීම කැපීපෙනේ. මීට අමතරව එදිරිසිංහ මහතා ISO22000 ආහාර සුරක්ෂිතතා කළමනාකරණය පිළිබඳ සුදුසුකම්ලාභියෙකුද වේ.

# ඡායා ගැලරිය

## අගමැතිඳුන් සිය උපන් දිනයට ආශිර්වාද ලබමින්...



## කථානායකතුමා කැනේඩියානු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තර කරයි



## 75 වන අයවැය අතරතුර තේ පැන් සංග්‍රහයේ ඡායා...




සන්නිවේදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka